මහා විහාරවංශික ශ්‍රී ජයවර්ධනපුර

# කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහා සංඝසභාව

සාහිත්‍ය චක්‍රවර්තී අග්ගමහාපණ්ඩිත විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය

## ආචාර්ය කොටපිටියේ රාහුල අනුනායක මහාස්ථවිර

ප්‍රධාන ලේඛකාධිකාරී

රාජමහා විහාරය
කෝට්ටේ.
දුරකථන 0382234930 / 0777957406

බෝධි රාජමහා විහාරය
තල්පිටිය, වාද්දුව
E-mail: korahula@gmail.com

2026. 10. 06

බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් තුමා
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ.

කොමසාරිස් ජෙනරාල්තුමනි,

<u>ගලගොඩඅත්තේ ඥාණසාර ස්ථවිරයන් වහන්සේ සම්බන්ධයෙනි</u>

ගලගොඩඅත්තේ ඥාණසාර ස්ථවිරයන් වහන්සේ මහාවිහාර වංශික ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝසභාවට අයත් භික්ෂුවකි. උන්වහන්සේ සම්බන්ධයෙන් අධිකරණය මගින් ලබාදී ඇති තීන්දුව පිළිබඳව කිසිදු විරෝධයක් හෝ අදහසක් අප ඉදිරිපත් නොකරන්නෙමු. එමෙන්ම අධිකරණයේ උත්තරීතරභාවය පිළිබඳ ඉහළින්ම පිළිගන්නෙමු. ඒ අතර බන්ධනාගාරය තුළදී උන්වහන්සේගේ සිවුර ගැලවීම සම්බන්ධයෙන් ඇතැම් මාධ්‍යවාර්තා දුටුවෙමි.

භික්ෂුවකට සිවුර පෙරවීම හා භික්ෂුවකගේ සිවුර ගැලවීම සම්බන්ධයෙන් පූර්ණ අයිතිය ඇත්තේ පැවිද්ද ලබා ඇති එම භික්ෂුවට හා එම භික්ෂුව අයත් මහා සංඝසභාවටය. එය අප රටේ දනට තහවුරු වී ඇති ක්‍රම වේදයට අනුව අදාළ නිකායේ හෝ මහාසංඝසභාවේ මහානායක මාහිමිපාණන් වහන්සේගේ අනුමැතියෙන්ම සිදුවිය යුතු ශාසනික කාර්යයකි.

ශාසනික නීතියට අනුව ඔහුගේ සිවුර පොරවා සිටීම හා අත්පස තබා ගැනීමට සැලැස්වීම මෙන්ම අදාළ භික්ෂුව පිටතට රැගෙන එන හැම අවස්ථාවකම ඔහුට නියමිත සිවුරෙන් පෙනී සිටීමට අවස්ථාව ලබාදීම මෙතෙක් ශාසනිකව හා අධ්‍යාත්මිකව තහවුරු වී ඇති සාම්ප්‍රදායික නීතියකි. එමෙන්ම එය නොසලකා හැරීම ශාසනයට ලබාදෙන වැරදි පූර්වාදර්ශයකි.

ගලගොඩඅත්තේ ඥාණසාර භික්ෂුව විනය පිටකයට අනුව පරාජිකා වී ඇති භික්ෂුවක් ලෙස හෝ සිවුර ගැලවීමට තරම් බරපතල හේතුවක් උන්වහන්සේ අයත් අප සංඝසභාව වෙත වාර්තාවී නොමැත. එමෙන්ම ශාසනික වශයෙන් ඔහු සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වා ඔහුගේ සිවුර ගැලවීම හෝ සිවුර තබාගැනීමට ඉඩ හැරීම අප සංඝසභාවට අයත් වගකීමකි.

එබැවින් උන්වහන්සේගේ සිවුර ඇත් නොකරන ලෙසත් සිවුර පිටින්ම පෙනී සිටීමට උන්වහන්සේට අවස්ථාව ලබාදෙන ලෙසත් කරුණාවෙන් දන්වමි.

මෙයට,

අග්ගමහාපණ්ඩිත සාහිත්‍ය චක්‍රවර්තී
විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කොටපිටියේ රාහුල අනුනායක මහාස්ථවිර

පිටපත්:-1. ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා, ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ
2. බෞද්ධ කටයුතු කොමසාරිස් ජෙනරාල්, බුද්ධශාසන අමාත්‍යංශය, කොළඹ 07.